# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


11.09.2012

## මාධ්‍ය නිවේදනය

රටක ජනතාවගේ යහ පෝෂණය එම රටෙහි ඵලදායිතාවයට ඍජුවම බලපාන අතර ඒ හරහා එම රටෙහි ආර්ථිකයටද විශාල බලපෑමක් එල්ල කරයි.එක්තරා වකවානුවක සෞඛ්‍ය අමාත්‍යාංශය “සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය” ලෙස නම් කර තිබුණේ එම වැදගත්කම සැලකිල්ලට ගැනීමෙනි.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ පෝෂණ ගැටළු රැසක් පවතින අතර, වෛද්‍යවරුන් ඇතුලු සමස්ථ සෞඛ්‍ය කාර්ය මණ්ඩල වල පෝෂණය පිලිබඳව දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීම යුගයේ ජාතික අවශ්‍යතාවයක්ව පවතී.

මේ පිළිබඳව වසර ගණනාවක් පුරා විවිධ මට්ටම් තුල පුළුල් කතිකාවතක් පැවතුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මානව පෝෂණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් හඳුන්වා දිය යුතු බවට සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් තීරණය කරන ලදි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි මෙම පාඨමාලාව ආරම්භ කිරීම සඳහා, වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය මූලික කටයුතු සූදානම් කර තිබුනත්, කුමක් හෝ හේතුවක් නිසා එම කටයුතු අතරමඟ ඇණහිට ඇත.

මේ ආකාරයට දින නියමයක් නොමැතිව මෙම පාඨමාලාව කල් දැමීම පිටුපස ළදරු ආහාර හා කිරිපිටි නිෂ්පාදන සමාගම්වල බලපෑමක් තිබේදැයි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට සැකපහල වී ඇත. උද්ගත වී ඇති තත්ත්වය පිලිබඳව සෞඛ්‍ය ලේකම්වරයා දැනුවත් කර ඇති අතර, ඉතා කඩිනමින් මෙම පාඨමාලාව ආරම්භ නොකලහොත් දැඩි පියවරක් ගැනීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තීරණය කර ඇත.

ස්තූතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්


වැඩි විස්තර - වෛද්‍ය ලසන්ත පිනදාස 0773625788
වෛද්‍ය නලින්ද හේරත් 0717876516
වෛද්‍ය තිමොති වික්‍රමසේකර 0772003062